Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## විශ්ව විද්‍යාල රෝහල
## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල රෝහල වෙත පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
(පූර්ණ කාලීන ස්ථිර පදනම මත)

1. **වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය**

**සුදුසුකම් :**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වැටුප් පරිමාණය :**

MO 1-1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x 2,270 - රු. 99,015)
*වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. - රු. 78,585.00

2. **වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය**

**සුදුසුකම් :**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වැටුප් පරිමාණය :**

MO 1-1 රු. (58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)
*වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ. - රු. 64,185.00

3. **වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය**

සුදුසුකම් :

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

වැටුප් පරිමාණය :

MO 1-1 රු. (58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)
*වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ. - රු. 60,050.00

4. **හෘද පෙනහළු නිවේශක**

සුදුසුකම් :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භෞතික විද්‍යාව විෂයක් වශයෙන් ඇති පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MA 4 - රු. (37,970 - 10 x 755 - 15 x 930 - 5 x 1,135 - රු. 65,145)
* හෘද පෙනහළු නිවේශක MA 4 පියවර 01 හි තබනු ලැබේ. - රු. 37,970.00

5. **විකලාංග වැඩපල කාර්මික ශිල්පී**

සුදුසුකම් :

I. ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 5 මට්ටමට (NVQ 5) නොඅඩු ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික (විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව.

හෝ

II. ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට (NVQ 5) නො අඩු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන උසස් ජාතික ඉංජිනේරු (විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව.

හෝ

III. තනතුරට අදාළව තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකය 5 මට්ටමට (NVQ 5) නොඅඩු මට්ටමක සහතිකයක් ලබා තිබීම.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MA 2-1 - රු. (30,310 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - රු. 50,940)
* විකලාංග වැඩපල කාර්මික ශිල්පී MA 2-1 පියවර 01 හි තබනු ලැබේ. - රු. 30,310.00

6. **ශ්‍රවණවේදී කාර්මික ශිල්පී**

සුදුසුකම් :

I. ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 5 මට්ටම (NVQ 5) නොඅඩු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන පූර්ණකාලීන අවුරුදු දෙකක (02) න්‍යායාත්මක හා සීමාවාසික ශ්‍රවණවේදී කාර්මික ශිල්පී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

II. ශ්‍රවණවේදී කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MA 2-1 - රු. (30,310 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - රු. 50,940)
* ශ්‍රවණවේදි කාර්මික ශිල්පි MA 2-1 පියවර 01 හි තබනු ලැබේ. - රු. 30,310.00

**පොදු කොන්දේසි :**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්ව විද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන දිවයිනේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
4. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
5. මෙම තනතුර ස්ථිර වන අතර, වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය, රාජ්‍ය සේවයෙහි රැකියාවෙහි නියුතුව සිටි නිලධාරීන් වසර එකක (01) පරිවාස කාලයකට යටත්වේ.
6. සේවක අර්ථ සාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්ව විද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධනවලට යටත්ව).
7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2021.10.25** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, වේරහැර" යන ලිපිනයට හෝ edassistant_uh@kdu.ac.lk යන විද්‍යුත් තැපෑලට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළයුතුය.
8. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.
9. අසම්පූර්ණ, ප්‍රමාදවී ලැබුණු සහ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
10. අයදුම්පත් භාගත කර ගැනීමට/ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.

**www.kdu.ac.lk**

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී ආර්ඩබ්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.